**IPRC/16/227**

# නැකැත්/බලි සිතුවම් කලාවේ උඩරට ආගමනය ටැම්පිට විහාර හා සොල්දර විහාර නැකැත් හා බලි සිතුවම්.

ගංගා දිසානායක[1*]

'බලි'ශාන්තිකර්මයක් ලෙස ක්‍රි.ව. 1457 දී ලංකාවට පැමිණි බමුණන් 19 දෙනකුගෙන් පැවත ආ අතර පසුකාලයක ඒවා 'බොදු බලි' ලෙස පරිවර්තනය වී ඇත. බලි ශාන්ති කර්මය වසරක් පාසා ම රජගෙදර පැවැත්වූ ප්‍රධාන උත්සව අංගයක් විය. ප්‍රමිලා බිසව වෙනුවෙන් කරන ලද බලි යාගය උඩරට දී කරන ලද වර්තමාන අවසන් බලි ශාන්ති කර්මයයි. නැකැත් - ජ්‍යොතිෂ්‍යයි හා පදනම් වන අතර නවග්‍රහයින් ගෙන් සිදුවන රෝග- පීඩා- ව්‍යාධි සමනය කරගනු පිණිස 'බලි' ශාන්ති කර්මය සිදුකරනු ලැබේ. මෙම පර්යේෂණයේ දී සතරකෝරලය, තුන්කෝරලය, නුවර, බුලත්ගම හා කොත්මලේ, මාතලේ යන උඩරට දිසාවන්හි ටැම්පිට විහාර හා සොල්දර විහාර 70කට ආසන්න සංඛ්‍යාවක් නිරීක්ෂණය කරනු ලැබිණි. ගල් ටැම් මත එලන ලද ලෑලි තට්ටුවක් මත මුල්කණු සිටුවා ඉදිකරනු ලබන කුඩා පිළිම ගෙය ටැම්පිට විහාරය වන අතර ආරුක්කු සහිත දැවැන්ත බිත්ති මත ලෑලි අතුරා ඒ මත ඉදිකරනු ලබන විශාල ප්‍රතිමා ගෘහය සොල්දර විහාර වේ. තේමා හා ආකෘතිමය ලෙස ගත් විට මේ සෑම විහාරයක ම සත්සතිය, සූවිසිවිවරණය, ශ්‍රාවක රූප, අග්‍රශාවක රූප, හා ජාතක (තෝරාගත් කීපයක්) බුද්ධ චරිතය ඇතුළත් වන අතර 17 වන සියවසේ අග භාගයේ සිට 19 වන සියවස මැද භාගය දක්වා මෙම විහාර ඉදිකිරීම් හා සිතුවම් නිමකිරීම සිදුකර තිබේ.

'නැකැත් හා බලි' විහාර සිතුවම් අතර ප්‍රමුඛස්ථානයෙහි ලා හමුවන්නේ දකුණු සම්ප්‍රදායේ සිතුවම් සහිත විහාරස්ථානවල වන අතර දොඩන්දූව ශෛලබිම්බාරාමය ඒ අතර ප්‍රධාන වේ. කැළණි විහාරය, කරගම්පිටිය සුබෝධාරාමය, සපුගස්කන්ද රජමහා විහාරය යන විහාරයන්හිදී ද මෙම සිතුවම් දක්නට ලැබෙන අතර ඒවා 18 වන සියවසේ අග භාගයේ සිට 20වන සියවස මුල්භාගය දක්වා කාලය තුල ඇඳ තිබේ.උඩරට සම්ප්‍රදාය ප්‍රමුඛ ව විහිදී ගිය මධ්‍යම හා සබරගමුව තුල බලි හා නැකැත් සිතුවම් දක්නට නොලැබෙන අතර ඒවා හමුවන්නේ පර්යේෂණ ක්ෂේත්‍රය වූ විහාරාරාම ජාලය තුල ද කීපයක පමණි. උඩතලවින්න ටැම්පිට විහාරය/ අත්තනගොඩ පොත්ගුල් විහාරය/ ගල්ලෙන්ගොල්ල පොත්ගුල් විහාරය/ බෝධිමල්කඩ ටැම්පිට විහාරය යන විහාරස්ථාන පහක මනා ලෙස ඇඳි බලි හා නැකැත් සිතුවම් දක්නට ලැබෙන අතර ඒවා 18වන සියවස අග භාගයේ සිට 19 වන සියවස අගභාගය යන කාලපරිච්ඡේදය තුළ අඳිනු ලැබූ ඒවා වේ. උක්ත දිසාවන්හි විහාර සිතුවම් කලාවේ තේමාවන්ට ආගන්තුක නැකැත් හා බලි සිතුවම් 18 වන සියවස අගභාගයේ දී ආගමන වීම දකුණු සම්ප්‍රදායේ චිත්‍ර තේමාවන්වලින් සිදු වූ බලපෑමෙන් උද්ගතවූවක් ද? යන්න පර්යේෂණ ගැටලුව වේ. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් වියනට විශේෂිත ව චක්‍රාකාර රාමුවක අඳිනු ලැබූ නැකැත් හා බලි සිතුවම් උඩරට විහාරවල දකුණු සම්ප්‍රදායේ චිත්‍ර ලෙස විග්‍රහ කර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

***ප්‍රමුඛ පද :*** *නැකැත්/බලි/ටැම්පිට විහාර/ සොල්දර විහාර/ දකුණු සම්ප්‍රදාය*

[1] සමකථන ප්‍රයේෂණ ආයතනය, ශ්‍රී ලංකාව *gangarajinee@gmail.com